සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019

# 43 - ක්‍රිස්තියානි ධර්මය

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

**45.** පෘතුගීසි සමයේ කතෝලික ධර්මදූතවරුන්ගේ ධර්මදානීය කටයුතු පහසුවෙන් කරගත හැකි වූයේ ඔවුන් තුළ පැවැති කුමන ලක්ෂණයක් නිසා ද?
(1) බුද්ධිමත් භාෂා ඥානය
(2) සරළ ජීවිත පැවැත්ම
(3) වැඩ වසම් ක්‍රමය
(4) සමාජ ජීවිත පැවැත්ම
(5) මූල්‍යමය පහසුකම් සැලසීම

**46.** ශුද්ධ බයිබලය සිංහල භාෂාවට පරිවර්තනය සහ ජනයා අතර ව්‍යාප්ත කිරීම ආරම්භ වූයේ කිනම් පාලන සමයේ දී ද?
(1) පෘතුගීසි
(2) ඉංග්‍රීසි
(3) සිංහල
(4) දමිළ
(5) ලන්දේසි

**47.** ශ්‍රී ලංකාවේ පළමු කන්‍යාරාම පාසල ආරම්භ කළ පැවිදි නිකාය වන්නේ,
(1) සුරදූති පැවිදි නිකායයි.
(2) අපොස්තලික කාර්මෙල් පැවිදි නිකායයි.
(3) ශුද්ධ වූ පවුලේ පැවිදි නිකායයි.
(4) යහපත් එඬේරාගේ පැවිදි නිකායයි.
(5) මරියතුමියගේ ප්‍රැන්සිස්කාන පැවිදි නිකායයි.

**48.** මානව සංවර්ධනය සඳහා 'පොදු යහපත' ඇති කිරීමේ අවශ්‍යතාව දෙවන වතිකාන ප්‍රකාශනයෙන් පැහැදිලි කරයි. මෙහි සඳහන් පොදු යහපත යනු,
(1) එකිනෙකාගේ ශුභසිද්ධිය සඳහා වැඩ කිරීමයි.
(2) සංවර්ධනයේ වැදගත්කම වෙනුවෙන් ඇප කැප වී වැඩ කිරීමයි.
(3) මිනුෂ්‍යයා ස්වාභාවයෙන්ම සමාජීය වන නිසා අනුන් සමග එකතු වී වැඩ කිරීමයි.
(4) සෑම ජන කොටසකගේම හා පුද්ගලයන්ගේ පූර්ණත්වයට ඉඩ සැලසීමයි.
(5) සහෝදරයාට ප්‍රේම කරමින් සමාජයෙන් කොන්වූවන් සමග එකතුව වැඩ කිරීමයි.

**49.** "සාමය යනු මානව පැවැත්ම තුළ පවතින නිසල බව හා සාධාරණත්වය ක්‍රියාත්මක වීම හා දයා කරුණාවේ ප්‍රතිඵලයකි" යනුවෙන් සඳහන් වන්නේ,
(1) වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නම් ලේඛනයේ ය.
(2) ලෝක සාමය නම් විශ්ව ලේඛනයේ ය.
(3) කතෝලික සභා ධර්මෝපදේශය නමැති ග්‍රන්ථයේ ය.
(4) වෙහෙසෙන මිනිස්සු නම් විශ්ව ලේඛනයේ ය.
(5) මව සහ ගුරුවරිය නම් විශ්ව ලේඛනයේ ය.

**50.** ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යටතේ දැනට ලියාපදිංචි වී ඇති කිතුනු සභා ගණන කීය ද?
(1) දෙකයි
(2) තුනයි
(3) පහයි
(4) හතයි
(5) අටයි

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019
## නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

විෂයය අංකය / பாட இலக்கம்: **43**

විෂයය / பாடம்: **ක්‍රිස්තියානි ධර්මය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 | 31. | 1 | 41. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 3 | 32. | 2 | 42. | 3 |
| 03. | 2 | 13. | 4 | 23. | 1 | 33. | 3 | 43. | 3 |
| 04. | 4 | 14. | 4 | 24. | 4 | 34. | 2/5 | 44. | 2 |
| 05. | 4 | 15. | 1 | 25. | 5 | 35. | 2 | 45. | 2 |
| 06. | 3 | 16. | 1 | 26. | 4 | 36. | 5 | 46. | 5 |
| 07. | 2 | 17. | 3 | 27. | 2 | 37. | 4 | 47. | 3 |
| 08. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 1 | 48. | 4 |
| 09. | 5 | 19. | 2 | 29. | 5 | 39. | 1 | 49. | 3 |
| 10. | 2 | 20. | 5 | 30. | 1 | 40. | 5 | 50. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019 (නව නිර්දේශය)
## ලකුණු දීමේ පටිපාටිය
## II පත්‍රය

1. (i) දේවානුභාවයෙන් ලේඛනගත කරන ලද ශුද්ධ ලියවිල්ලේ අරමුණු **දෙකක්** (2 තිමති 3:16 ට අනුව) ලියන්න. (ලකුණු 02යි)

(ii) ස්වභාව ධර්මයේ නීතිය ඉක්මවා විශේෂ ආකාරයෙන් හා අද්විතීය ආකාරයෙන් සිදු වූ දේව අනාවරණයෙහි අංශ **දෙක** ලියන්න. (ලකුණු 04යි)

(iii) දේවානුභාවයේ ප්‍රභේද **තුන** නම් කරන්න. (ලකුණු 06යි)

(iv) තෝරාගත් ජනතාවට දෙවියන් වහන්සේ අනාවරණයවීම තුළ ඔබට ලැබෙන අත්දැකීමෙන් ඔබ විසින් සමාජයට කරන සේවා **හතරක්** පහදන්න. (ලකුණු 08යි)

01.

I
- ඉගැන්වීමට
- දුරුමත දුරු කිරීමට
- හික්මවීමට
- ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට උපදෙස් දීමට

(කරුණු දෙකකට **ලකුණු 02**)

II
- ස්ව අනාවරණය - තමන් වහන්සේ පිළිබඳ අනාවරණය
- උන්වහන්සේගේ ගැලවීමේ සැලැස්ම පිළිබඳ අනාවරණය

**(කරුණු දෙකකට ලකුණු 04 යි)**

III
- එඩේරික දේවානුභාවය
- දෙසීම සඳහා වූ දේවානුභාවය
- ලිවීම සඳහා අණ ලැබීම

**(කරුණු තුනකට ලකුණු 06 යි)**

IV
- දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාව වන ඉශ්‍රායෙල් ජනතාව සෑම අවස්ථාවකදීම ආරක්ෂාව හා මගපෙන්වීම පෙන්වූවා සේ (රාත්‍රී කාලයේ දී ගිනි ටැඹ දහවල් කාලයේ දී වළාකුළ) සමාජයේ නොමගයන පුද්ගලයන්ට අවශ්‍ය මග පෙන්වීම හා ආරක්ෂාව සැලසීම, දිව්‍ය සංරක්ෂණය තුළ ඔවුන් පෝෂණය කිරීම
- සමාජයේ වහලුන් වශයෙන් සිටි ඉශ්‍රායල් ජනතාව දෙවියන් වහන්සේ ගලවා ගත්තාක් මෙන් අප සමාජය තුළ නොයෙකුත් ශාරීරික හා මානසික වශයෙන් පීඩා විඳින අසරණ අයට පිහිට උපකාර කිරීම, ඔවුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීම
- ඉශ්‍රායල් ජනතාව නොයෙක් අවස්ථාවලදී දෙවියන්ට මැසිවිලි කීවත් (උදා: ජලය හා ආහාර නොමැති වූ විට) දෙවියන් වහන්සේගේ කරුණාව ඔවුන්ට නොඅඩුව ලැබුනි. ඒවාගේ සමාජයෙන් කුමණ ප්‍රශ්න පැණ නැගුනත් අන්‍යය වෙනුවෙන් ඉදිරිපත් වී ඔවුන්ගේ අවශ්‍යතා සපුරාදීමට කටයුතු කිරීම
- මෝසෙස් තුමා සේවකත්වයේ ලක්ෂණ පෙන්වූවා සේ අප ද සෑම කාර්යයක දීම අන්‍යයට සේවය කිරීමට ඉදිරිපත් විය යුතුය.

**(මෙවැනි කරුණු හතරක් සඳහා ලකුණු 08 යි)**

**2.** (i) දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිසාගේ ආහාර සඳහා **නොවන** අති විශේෂ ශාක දෙවර්ගය නම් කරන්න. (ලකුණු 02යි)

(ii) යාවේ හා පූජක සම්ප්‍රදායවල කතුවරුන් සඳහන් කරන ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුමේ වැදගත් කරුණු **දෙක** ලියන්න. (ලකුණු 04යි)

(iii) මිනිසා පාපයට වැටීම කරණකොටගෙන බිඳ වැටුණු සබඳතා **තුනක්** ලියන්න. (ලකුණු 06යි)

(iv) "ඉශ්රායෙල් ජනයා සිනයි ගිවිසුම මගින් ලද කැඳවීම නූතන කිතුනුවාට ප්‍රසාද ස්නාපනය මගින් හිමි වේ." එම කැඳවීම තුළ සමාජයට ඔබ කරන්නා වූ දූත සේවා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 08යි)

02.

I
- ජීවන වෘක්ෂය
- හොඳ නරක අවබෝධ කර ගැනීමේ වෘක්ෂය

**(කරුණු දෙකකට ලකුණු 02 යි)**

II
- අසංඛ්‍ය වූ දරු පරපුරක් (උත් 15:5, 17:5)
- ඔවුන් ට සදහටම හිමි වන දේශයක් (උත් 15:21, 17:8)

**(කරුණු දෙකකට ලකුණු 04 යි)**

III
- දෙවියන් වහන්සේ හා මනුෂ්‍යා අතරත්
- මිනිසා හා ස්ත්‍රිය අතරත් (ඉෂ් හා ඉෂ්ෂහ්)
- මිනිසා හා ස්වභාව ධර්මය අතරත් (ආදම් හා අදමහ්)

පැවැති සබඳවා බිඳවැටුනි

**(කරුණු තුනකට ලකුණු 06 යි)**

IV
- ප්‍රසාද ස්නාපනය මගින් එඬේරික (රාජකීය) පූජක, දිවැසි යන ත්‍රිවිධ වූ කාර්යයන් හිමි වේ. ජාති ආගම් කුල භේද නොතකා සියලු දෙනාටම එක හා සමානව දෙවිඳුන්ගේ දරුවන් සේ සලකා අවශ්‍යතා ඉල්ලීමට පෙර අවශ්‍ය දේ ඉටු කිරිම
- මිසමේ දහම් පාසලට හා අනෙකුත් සමිති සමාගම් වලට බැදි තමන්ගේ කාලය හා ශ්‍රමය කැපකරමින්, වැය කරමින් ගිහි අපෝස්තලික සේවාවල යෙදීම
- සමාජයේ අසරණ වී සිටින අය වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියේ මැදිහත් කරුවෙකු වෙමින් ඔවුන්ට සේවය කිරිම හා ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරිම (පොදු පූජකවරය තුළ)
- කාලයේ සලකුණු තේරුම් ගනිමින් අපට පැවරෙන වගකීම් හා යුතුකම් සමාජය තුල නොපිරිහෙලා ඉටු කිරිම
- දේව වචනයට පිටුපා කටයුතු කරන අයට දේව වචනය අනුව ජීවත් විය යුතු ආකාරය පහදා දීම
- අභියෝග හමුවේ නොසැලි දේව විශ්වාසයෙන් තම කාර්යයන් නොපිරිහෙලා ඉටු කිරිම

**(මෙවැනි කරුණු හතරක් සඳහා ලකුණු 08 යි)**

3. (i) ධර්මය ප්‍රචාරය කිරීම සඳහා පෘතුගීසි ධර්මදූතවරුන් අනුගමනය කළ ධර්ම ප්‍රචාර ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් බිහි කළ මධ්‍යම පාසල් කොමිසම මගින් ඉටු වූ සේවා **දෙකක්** ලියන්න. (ලකුණු 04යි)

(iii) ලන්දේසි යුගයේ ලංකාවේ අධ්‍යාපනය සාර්ථක වීමට බලපෑ කරුණු **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 06යි)

(iv) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති මගින් අද සමාජයේ ගිහි නායකයන්ට ගත හැකි ආදර්ශ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08යි)

I
- දේශීය භාෂා ඉගෙන ගෙන එම භාෂාවලින්ම ධර්මය ප්‍රචාරය කිරීම
- ආගමික පතපොත දේශීය භාෂාවන්ගෙන් ලිවීම
- කුඩා දරුවන්ට දහම ඉගැන්වීමට ප්‍රාථමික පාසල් ඇරඹීම
- විවිධ දයා සේවාවන් හි නිරත වීම
- නාට්‍ය, පෙරහැර යාම. සුරුවම් භාවිතය වැනි ක්‍රම මගින් ආගමික ප්‍රබෝධයක් ඇති කිරීම

**(කරුණු දෙකකට ලකුණු 02 යි)**

II
- කොළඹ ඇකඩමිය සමෘද්ධිමත් කිරීම
- ගුරු පුහුණුව සඳහා " නෝමල් පාසල් " ආරම්භ කිරීම
- අධ්‍යාපනයට ප්‍රායෝගික නැඹුරුවක් ලබා දීම සඳහා මධ්‍යම පාසල් තුනක් ආරම්භ කිරීම (ගාල්ල, මහනුවර, කොළඹ)
- මහනුවර සහ කොළඹ උසස් බාලිකා පාසල් ආරම්භ කිරීම

**(කරුණු දෙකකට ලකුණු 04 යි)**

III
- ක්‍රමානුකූල හා සංවිධානාත්මක බවකින් යුතු අධ්‍යාපනයක් මෙරට ක්‍රියාත්මක කිරීම
- සෑම දේවස්ථානයක් අසලම පාසලක් පිහිටු වීම
- අධ්‍යාපනය අනිවාර්ය වූ අතර, සියලුම ළමයින් පාසල්වලට යැවීම අනිවාර්ය වීම
- පාසල් නොයවන දෙමාපියන්ට දඩ ගැසීම
- අධ්‍යාපනය පිළිබඳ සෘජු වගකීම ලන්දේසි රජය විසින් භාර ගැනීම
- වයස අවුරුදු 15 තෙක් අධ්‍යාපනය අනිවාර්ය වූ අතර, පාසලෙන් විභාගයක් පවත්වා " ලාගිර්ඩන් " නැමති සහතිකය ලබා දීම
- දක්ෂ ළමයින්ට උසස් අධ්‍යාපනයට, ගුරු පුහුණුවට හා උසස් අධ්‍යානය සඳහා විදේශ ගතවීමට ඉඩ සැලසීම
- සකෝලාකල් කොමිසම නැමති විශේෂ ආයතනයක් මගින් පාසල් වලට ගුරුවරුන් පත් කිරීම, පාලනය කිරීම, පරීක්ෂකවරුන් මගින් පාසල් නිරීක්ෂණය

**(කරුණු තුනකට ලකුණු 06 යි)**

IV
- ජුසේවාස් මුනිතුමා දේශපාලන සම්බන්ධයක් හෝ රාජ්‍ය අනුග්‍රහයක් හෝ නොමැතිව ධර්මදූත ප්‍රචාරය සාර්ථකව ඉටු කලාක් මෙන් ගිහි නායකයන් තමන්ට ලැබෙන පෞද්ගලික වාසි නොතකා කාලය හා ශ්‍රමය ධර්මප්‍රචාර කටයුතු සඳහා යෙදවීම

- මාරා නැමැති ස්ථානයේ පිපාස වීම
  දින තුනක් යන තුරු පිපාසව සිටි ජනයාට කරදිය ජලය මිරිදිය ජලය බවට පත්කර බීමට දුන් සේක.

- මස්සා හා මෙරිබා යන ස්ථානවලදී ජලය ලැබීම
  රෙපිඩිම් නම් ස්ථානයේ ජලය නොතිබුණු අතර මෝසෙස්තුමා දේව නියමය මත පර්වතයට තට්ටු කළ විට ජලය ලැබීම

- පාළුකරයේදී (සීන් කාන්තාරයේදී) ආහාර සැපයීම
  ආහාර හිඟවීම හේතුවෙන් ඊශ්‍රායෙල් ජනතාව මැසිවිලි නැගූ විට ඔවුනට ආහාර ලෙස මන්නා හා වටුවන් ලබා දුන් සේක.

- ලෝකඩ සර්පයා
  විසකුරු සර්පයන් දෂ්ඨ කිරීමෙන් ඉශ්රායෙල් සෙනඟ බොහෝ සෙයින් මරණයට පත් වන්නට වූ විට සමිඳානන් වහන්සේ කී පරිදි මෝසෙස් තුමා ලෝකඩ සර්පයෙකු තනා රිටක ගසා පෙන්වූ අතර එදෙස බැලූ ඔවුන් සුවපත් විය.

- ආක්‍රමණ වලින් ආරක්ෂා වීම.
  ඉශ්රායෙල් ජනයා අමෙලෙක්වරුන්ගේ ආක්‍රමණයට ගොදුරු වූ අතර යාච්ඤා කිරීම හේතු කොට ගෙන ඇමෙලෙක්වරු පරාජය විය. ඉශ්රායෙල්වරුන්ට ජය අත් විය.

- රතු මුහුද තරණය කිරීම
  මිසර හමුදාව ලුහු බඳිමින් එන විට මුහුද දෙබෑ වී ඉශ්රායෙල් ජනතාවට එතෙර වීමට මඟ පාදා දුන් සේක.

**(මෙවැනි කරුණු 05 ක් ලියා ඊට අදාලව පැහැදිලි කර ඇත්නම් ලකුණු 2x5=10 යි)**

(ii) කිතුනුවකු වූ ඔබ එදිනෙදා ජීවිතය තුළින් දිව්‍ය සංරක්ෂණය අත්දකින අවස්ථා **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

1. ජීවිත ගමන තුල එදිනෙදා මුහුණ දීමට සිදුවන දුක් කරදරවලදී.
2. අපට පැමිණෙන ජීවිත අභියෝග වලදී.
3. හදිසියේ යම් යම් තීරණ ගැනීම් වලදී.
4. ජීවන ගමනේ තනිවීම්, අසරණ වීම් තුලදී.
5. හදිසි වෙන් වීමකදී.

**(මෙවැනි කරුණු 05ක් ලියා ඊට අදාලව පැහැදිලි කර ඇත්නම් ලකුණු 2x5=10 යි)**

**අභිමතාර්ථය :- කිතුනු ඉගැන්වීම් වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි.**

**6.** (i) කන්ද උඩ දේශනය මගින් ඉදිරිපත් කරන පරමාර්ථ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I
- ශ්‍රාවකයන්ගේ ධර්මිෂ්ඨකම විනය ධරයන්ගේ හා පරිසිවරුන්ගේ ධර්මිෂ්ඨකම අභිබවා යා යුතු බව.
- ක්‍රිස්තුන් වහන්සේ නව මෝසෙස් ලෙස නව කන්දක් මත නව ව්‍යවස්ථාවක් දානය කරන බව
- පැරණි ව්‍යවස්ථාව සම්පූර්ණ කර නව ව්‍යවස්ථාවක් (ප්‍රේමයේ ව්‍යවස්ථාවක්) දානය කරන බව
- දේව රාජ්‍යයට ඇතුළුවීමට කැමති අය පොළොවේ ලවණ මෙන් ද ලෝකයේ ආලෝකය මෙන් ද ක්‍රියාකළ යුතු බව.
- මිනිස් සිත් තුළ ඇති අවම ගති ඉවත් කර ඇතුළාන්ත පිරිසිදු බවකින් ජීවත් විය යුතු බව.

**(මෙවැනි කරුණු 05 කට ලකුණු 2x5=10 යි)**

(ii) ධර්මදූත සේවය සඳහා සූදානම් වන්නන් තුළ තිබිය යුතු ගුණාංග **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

II
- දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන්, වැඩිපුර යමක් නොගෙන සැහැල්ලුවෙන් ගමන් කළ යුතුය. මන්ද ඔවුන් දිව්‍ය සංරක්ෂණය තුල යැපිය යුතුය.
- අල්පේච්ඡ ජීවිතයක්, සරල ජීවිත පැවැත්මක් අත්‍යවශ්‍යය.
- සාමයේ පිණිවිඩකරුවන් මෙන් නිතරම අනුන් වෙනුවෙන් පරිත්‍යාග වීමට හා කාලය, ශ්‍රමය වැය කිරීමට පුරුදු පුහුණු විය යුතුය.
- තමන්ට එල්ලවිය හැකි දුෂ්කරතා හා සිත් රිදීම් වලදී අධෛර්යට පත් නොවී තම කාර්යය නොපසු බට වීර්යයෙන් කිරීමට උත්සහ කළ යුතුය.
- සෑම පුද්ගලයෙක්ම දේව දරුවෙක් සේ සලකා සැමටම එක සේ සැලකිය යුතුය. ගරුකළ යුතුය.
- නිතරම දෙවිඳුන් සමග සිටිමින් ශුද්ධ ලියවිල්ල තම ජීවිතයේ කොටසක් කරගත යුතුය.

**(මෙවැනි කරුණු 05 ට ලකුණු යි)**

**අභිමතාර්ථය :- ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂි දැරූ ආකාරය පිළිබඳව සිසු ආකල්ප පරීක්ෂා කිරීම**

**7.** (i) මිලාන් ආඥාවෙන් පසු ලැබුණු වරප්‍රසාද **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I
- කිතුනුවන්ගේ සබත ලෙස හඳුන්වන ඉරුදින නිවාඩු දිනයක් බවට පත් කරන ලදි.
- කුමන අපරාධයකට අසුවුවද කුරුසපත් කිරීම අවලංගු කෙරිනි.

- රෝම ඇදහිලිවල තිබූ දූෂිත චාරිත්‍ර වාරිත්‍ර අවලංගු කෙරිනි.
- කිතුනු පූජකවරුන් අයබදුවලින් නිදහස් කෙරිනි.
- රාජ්‍යයේ පරිපාලන තනතුරු දැරීමට කිතුණුවන්ට අවස්ථාව දෙන ලදි.
- කුරුසියේ ලකුණු රාජ්‍යයේ නිල ලාංඡනය බවට පත්විය.
- ලැටරන් මාලිගය ශුද්ධෝත්තම පියතුමන්ට ප්‍රධානය කෙරිණි.
- කිතුණුවන්ගෙන් පැහැරගත් සියලු ඉඩකඩම් දේපළ නැවත ඔවුනට ලබා දෙන ලදි.
- කිතුනුවන්ට විරුද්ධව පනවා තිබූ සියලු නීති අහෝසි කෙරිණි

**(මෙවැනි අදහස් 05 ක් විස්තර කර ඇත්නම් ලකුණු 2x5=10 යි )**

(ii) පීඩන සමය තුළ කිතුනුවන් අතර දිස් වූ විශේෂ ලක්ෂණ **පහක්** සඳහන් කර, අද සමාජයෙන් ඔබට එල්ලවන අභියෝගවලට මුහුණ දෙන ආකාරය එම කරුණු පදනම් කොටගෙන පහදන්න. (ලකුණු 10යි)

II
- පැමිණි සෑම අභියෝගයකටම නිර්භීතව මුහුණ දීම
- විශ්වාසය සුරැකීම සඳහා දැරූ ප්‍රයත්නය
- අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කිරීම
- පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත්දැකීම
- නිරතුරුවම විශ්වාසයට සාක්ෂි දැරීම
- පීඩා මාධ්‍යයේ විශ්වාසය හා කිතු දහම වර්ධනය වීම

**අභියෝගවලට නිර්භීතව මුහුණ දීම**

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම.

- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි නොවී පුනරුත්තාපන කටයුතුවලට සහභාගී වී සමාජයට හොඳ පුරවැසියකු වීම

**විශ්වාසය සුරැකීම සඳහා ප්‍රයත්නය දැරීම**

දෙමාපියන්ගේ හා දෙවිඳුන්ගේ ආදරයෙන් සෙනෙහසින් මිදී වෙනත් පුද්ගලයින් පිටුපස හඹාගෙන යාම. (මූල ධර්මවාදීන්ගේ බොරු ඉගැන්වීම් පසුපස ගොස් තම විශ්වාසය පාවා දීම)

දෙමාපියන්ගේ හා දෙවිඳුන්ගේ සෙනෙහසට මුල් තැන දීම දෙවිඳුන්ගේ හා දෙමාපියන්ගේ විශ්වාසය තහවුරුවන පිණිස නිරතුරුවම කටයුතු කිරීම.

- නැකත් බැලීම, අංජනම් එළි, සාස්තර බැලීම, වේලාව බලා වැඩ කිරීම වැනි දෑ අප විශ්වාසයට එරෙහිව යැමක් බව අවබෝධ කර ගැනීම

**අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කිරීම**

ලෞකිකත්වයට මුල්තැන දීම

- ලෞකිකත්වයට නැඹුරු නොවී අධ්‍යාත්මිකත්වයට මුල් තැන දී කටයුතු කිරීම

**පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත්විඳීම**

අසාධාරණත්වය තුළ කටයුතු කිරීම

- අයුක්තියට අසාධාරණයට එරෙහිව සෑම මොහොතක දීම සෑම ස්ථානයකදීම ශුද්ධාත්ම බලය තුළින් සාක්ෂි දැරීම. (දේව වටිනාකම් දේව රාජ්‍යයේ වටිනාකම් වලට සාක්ෂි දැරීම. ඉවසීමෙන් හා ප්‍රඥාව ඇතුව ඇතුලුව ක්‍රියා කිරීම)

**නිරතුරුවම විශ්වාසයට සාක්ෂි දැරීම**

නවීන තාක්ෂණික උපකරණවලට වහල් වී නොමග යාම

- අන්තර්ජාලය, දුරකථනය යහපත් දේ සඳහා හැසිර වීම සහ එම නවීන උපකරණ වලට අබ්බැහි නොවී දේව විශ්වාසය වර්ධනය කර ගැනීමට නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(මෙවැනි කරුණු පහක් විස්තර කර ලියා ඇත්නම් ලකුණු 2x5=10 යි )

**අභිමතාර්ථය :- ශුද්ධ වූ සභාව කාලානුරූපී කර ගැනීමට නිසි මග ගැන්වීම සඳහා සභාව දක්වූ දායකත්වය පිළිබඳ සිසු අවබෝධය පරීක්ෂා කිරීම**

8. (i) දහසය වන සියවසේ ශුද්ධ වූ සභාවේ ප්‍රතිසංස්කරණ කාර්යය ඉදිරියට ම ගෙන යාමට නායකත්වය ගත් පූජක, පැවිදි නිකාය **පහක්** නම් කර ඒවා පිළිබඳ ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරු දීම සඳහා ආරම්භ කරන ලද ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (1545–1563) විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘති **පහක්** සඳහන් කර, ඒවා ඔබගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

- කාර්මෙල් නිකාය
- කැපුචින් නිකාය
- වින්සෙන්කියානු නිකාය
- ජේසු නිකාය
- දයාවේ සෙහොයුරින්ගේ නිකාය
- දලාසල් නිකාය

**(නිකායන් 5 ක් නම් කිරීමට ලකුණු 05)**

**කාර්මෙල් නිකාය**

- පලස්තීනයේ කාර්මෙල් කන්දෙහි 12 වන සියවසෙහි ආරම්භ වී ඇත.
- මෙම නිකායට අයත් තාපසයන් කාර්මෙල් කන්දෙහි හුදකලාව ජීවත් වූ අතර දැඩි තාපස ජීවිතයක් ගත කළහ
- ශු. සයිමන් ස්ටොක් මෙම පැවැදි ජීවිත ක්‍රමය එංගලන්තයට හඳුන්වා දුන්නේය.

- විශ්ව විද්‍යාලය ආශ්‍රිත නගරවල කාර්මෙල් නිකායේ තාපසාරාම බිහි කිරීමට කටයුතු කළේ තාපසවරුන් විශ්ව විද්‍යාලවල දේශනා කරමින් ධර්මදූත සේවයේ යෙදුණු බැවිනි.
- කාර්මේල් නිකායේ පැවිදිවරිය වූ අවිලාහි තෙරේසා තුමිය (1515-1582) තම පැවිදි නිකාය තුළ නවෝදයක් ඇති කිරීමට උත්සහ කළාය
- කාර්මේල් නිකායේ තිබූ තාපස දිවියේ භාවනා යෝගී ජීවිතය නැවත ඇති කරලීමට අවිලාහි තෙරේසා තුමියගේ උත්සාහය නිසා හැකිවිය. ඇයට කුරුසියේ ජුවාම් තුමාගේ සහයෝගය ලැබිණි.
- " පූර්ණ දිවියකට මග" (The way of Perfection) 'ඇතුළාන්ත මන්දිරය" (The Interior Castle) අවිලාහි තෙරේසාතුමිය විසින් රචිත විශිෂ්ඨ අධ්‍යාත්මික කෘති වේ.
- අවිලාහි තෙරේසා තුමියගේ යොමු කිරිම හා මගපෙන්වීම මගින් කුරුසියේ ජුවාම් තුමා (1542-1591) පුනරුදයට දායක විය. මෙතුමා විසින් අධ්‍යාත්මික ජීවිතය පිළිබඳ පහත ග්‍රන්ථ ලියනු ලැබ ඇත.

**කාර්මේල් පරිවර්තය නැගීම** - The Ascent of Mount Carmel
**ආත්මයේ අඳුරු රාත්‍රිය** - Dark Night of the Soul
**අධ්‍යාත්මික ගීතය** - The Spiritual Canticle
**ප්‍රේමයේ ජීවන දැල්ල** - The Living Flam of Love

- මොවුන් දෙදෙනා විසින් රචිත අධ්‍යාත්මික කෘති බොහෝ දෙනාගේ ජීවිතවලට ඉමහත් සහනයක් විය.
- අධ්‍යාත්මික ජීවිතයේ දේව සබඳතාව අත්දැකීමට බැගැපත්කම නැතිවම බැරිය. යන සංදේශය අනුව කාර්මේල් නිකායික ජේසුගේ කුඩාමල වන තෙරේසා තුමිය ජීවිතයෙන් සාක්ෂි දරා ඇත.

**කැපුචින් නිකාය**

- 16 වන සියවසේ ඉතාලියේ බිහි වූ පැවිදි නිකායයන් අතරින් කැපුචින් නිකාය ප්‍රධාන වේ. මෙය 13 වන සියවසේ ආරම්භ වූ ෆ්‍රැන්සිස්කානු නිකායයෙන් බිහි වූවකි.
- අසිසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් තුමා නීතිය ඉතා සූක්ෂම ලෙස පිළිපැදිය යුතු යැයි කළ ප්‍රකාශය හා ශුද්ධ ලියවිලි අනුව ජීවිත ක්‍රමය නැවත ඇති කරලීමේ අදහසින් කැපුචින් නිකාය බිහි කරන ලදි.
- මොවුනට නායකත්වය ලබාදෙමින් ෆ්‍රැන්සිස්කානු නිකායේ මතේඕ ද බස්සිකෝගේ දායකත්වය තුළ බිහිවූවකි.
- නිකාය ආරම්භයේ දී ඉමහත් බාධක ශු. සභාවෙන් ම මතු වුව ද මෙම නවෝදය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදිණි. මොවුහු තම ධර්මෝපදේශ සේවයත්, ආශ්‍රමික ජීවිකයත් එකට එක් කර දිවි ගෙවූහ, ලෙඩුනට උපස්ථාන කරමින් හා ඉතා දුෂ්කර ලෙස වැඩ කිරීමෙන් ලබා ගත් ආදායමෙන් ජීවත් වූහ, ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවාදීන්ට විරුද්ධ ව දේශනා කළහ, දිළිඳු ජීවිතයක් ගත කළහ.

**වින්සෙන්තියාන නිකාය**

- ශුද්ධ වු වින්සෙන්ති ද පාවුලු තුමා සභා ප්‍රතිසංස්කරණය සඳහා පූරෝගාමී ව කටයුතු කළ කෙනෙකි.

- මෙතුමා දිළිඳුන් ද කෙරෙහි ගැඹුරු ආදරයක් හා කරුණාවක් දැක්වූ කෙනෙකි.

- ක්‍රි.ව. 1625 වින්සන්ට් ද පාවුලු තුමා විසින් වින්සෙන්තියානු නිකාය ප්‍රංශයේ ආරම්භ කෙළේය. මෙහි අරමුණු වූයේ දූගීන්ට ධර්ම දානය හා පූජක පුහුණුවය.

- කතෝලික ධර්මය දේහනා කර ප්‍රතිසංස්කරණවාදී ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම මොවුන්ගේ සේවාව විය.

- ශු.සභාව තුළ ප්‍රතිසංස්කරණ ඇති කරලිමට ක්‍රම කෙක් වින්සේන්තියානු නිකායය විසින් අනුගමනය කරන ලදි.

    1. පැවිදි නිකායයන් සංවිධානය කර ආදර්ශවත් පූජකවරුන් බිහි කිරිම.
    2. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් අනුව පූජකවරුන් බිහි කිරිමේ වගකීම පැවිදි නිකායයන්ට ලබා දීම

- ශුද්ධ වූ වින්සෙන්ති පාවුලා තුමා විසින් 1633 වින්සන්ට් ද පාවුලු මුනිතුමාගේ දයාවේ සොහොයුරියන්ගේ නිකාය ද (Sister of Charity St. Vincent De Paul) ආරම්භ කරන ලදි.

**ජේසු නිකාය**

- සභා ප්‍රතිසංස්කරණවාදී පසුබිමක බිහි විය.

- ලොයලාහි ශුද්ධ වූ ඉග්නාසියුස් තුමන් විසින් ක්‍රි.ව. 1533 ආරම්භ කරන ලදි.

- එතුමා යුද වැදි තුවාල ලැබ ප්‍රතිකාර ලබමින් සිටි කාලය තුළ කියවීමට ලද ශුද්ධ ලියවිල්ල හා ශුද්ධවන්තයන්ගේ ජීවිත කථා තම ජීවිත පරිවර්තනයට හේතු විය.

- නුගත් ජනතාවට දිළිඳුනට අධ්‍යාපනය ලබා දිමේ අරමුණින් බිහිවූ මෙම නිකාය පසුව රාජ කුමාරවරුන්ට හා රජවරුන්ට ද අධ්‍යාපනය ලබා දිමට යොමු විය.

- වේදහාර රකිමින් කැප වූ ජීවිතයක් ගත කිරීමත් ශුද්ධෝත්තම පියතුමාගේ නියෝගවලට කීකරු වීමට පොරොන්දු වීමත් මෙම නිකායේ විශේෂ ලක්‍ෂණයකි.

- කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා ආරක්‍ෂා කර ගැනීම ජේසු නිකායික ධර්මදූතවරුන්ගේ කාර්යය විය.

- ප්‍රතිසංස්කරණ සභා බිහිවූ යුගයේ කතෝලික සභාවේ නවෝදය ජේසු නිකායික පූජා ප්‍රසාදින් වහන්සේලා විසින් ඉදිරියට ගෙන යන ලදි.

- අධ්‍යාත්මිකත්වයෙන් හා දේව ධාර්මිකත්වයෙන් පූර්ණ වූ මොවුන් අතරින් ශුද්ධ වූ ඉග්නාසියුස් තුමා විසින් රචිත " අධ්‍යාත්මික පුහුණුව " (Spiritual Exercise)